(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 49 දරන විසර්ජන (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 10 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 දෙසැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිළ : රු. 3.50** **තැපැල් ගාස්තුව : රු. 3.50**

**1999 අංක 49 දරන විසර්ජන (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 10 වැනි දින]

එල්.ඩී.—ඕ. 153/34.

## 1998 අංක 61 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1999 අංක 49 දරන විසර්ජන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 1998 අංක 61 දරන විසර්ජන පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "මුදල්වල සමස්තය රුපියල් නව දහස් හත්සිය දෙකෝටි හැත්තෑ ලක්ෂයක් නොඉක්මවන" යන වචන වෙනුවට "මුදල්වල සමස්තය රුපියල් එකොළොස් දහස් හත්සිය දෙකෝටි හැත්තෑ ලක්ෂයක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1998 අංක 61 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.